**දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසැල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය - මධ්‍යම මට්ටම- 2014**

---

දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසැල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2012 මැයි 18 දින එළඹි අංක 5037-එල් කේ දරන මූල්‍ය ගිවිසුමේ 2 උපලේඛනයේ 2 වගන්තියේ බී.3 ඡේදයේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ කටයුතු ජාතික මට්ටමින් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින්ද පළාත් මට්ටමින් පළාත් සභා මඟින්ද සිදුකිරීමට අපේක්ෂා කෙරේ.ජාතික මට්ටමින් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සිදු කරන කටයුතු පිළිබඳ අදහස් දැක්වීම් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාලය

---

ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ලට අනුව, දිවයිනේ සාමාන්‍ය අධ්‍යාපන අංශය මුහුණ දෙන අභියෝගවලට ආමන්ත්‍රණය කෙරෙන 2012 – 2016 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය සහාය සැපයීමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. ව්‍යාපෘතියේ මධ්‍යම මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයයි. ශ්‍රී ලංකාවේ දැනුම පදනම් කරගත් ආර්ථික හා සමාජයීය සංවර්ධනය සඳහා පදනමක් සැපයීම උදෙසා ප්‍රාථමික හා ද්විතීය අධ්‍යාපනයට ප්‍රවේශය හා ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු.මිලියන 11,000 කට සමාන විගැහි (SDR) මිලියන 64.1 ක් (එජඩො මිලියන 100) වේ. ඉන් සියයට 70 සිට 80 දක්වා අරමුදල් පළාත් අධ්‍යාපන අධිකාරීන් සඳහා වෙන් කරන ලද අතර ශේෂය අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන්කර ඇත. 2012 ඔක්තෝබර් 01 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2017 ජූනි 30 වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව සඳහා කළමනාකරණයේ වගකීම

---

මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තවේ සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද අධ්‍යාපන අංශයේ මධ්‍යම ආයතන තුනෙහි වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ අධ්‍යාපන අංශයේ ආයතන තුනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව, මුදල් රෙගුලාසි 150 හා මහා භාණ්ඩාගාරයේ 2014 දෙසැම්බර් 01 දිනැති අංක 239/2014 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුකූලව පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් අධ්‍යාපන අංශයේ මධ්‍යම ආයතන තුන විසින් පවත්වාගෙන යනු ලබන පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන් 2013 අංක 36 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ ශීර්ෂ අංක 126 යටතේ 2014 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 විධිවිධානවලට සහ මහා භාණ්ඩාගාරයේ 2014 දෙසැම්බර් 01 දිනැති අංක 239/2014 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර තිබූ බව සහ ඉහත සඳහන් ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්, වාර්ෂික ඇස්තමේන්තු සහ අධ්‍යාපන අංශයේ මධ්‍යම ආයතන තුන විසින් පවත්වා ගනු ලබන පොත් හා වාර්තා සමඟ සැසඳුණු බව,

(ආ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය
---------------------------------------

3.1 අරමුදල් උපයෝජනය
-----------------------------

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මධ්‍යම මට්ටම සඳහා මූල්‍ය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | **2014 වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල්** | | **2014 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල්** | |
|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| ප්‍රදාන නියෝජිතායතනය | 30 | 3,300 | 810 | 6 | 810 | 10 | 1,240 |
| | 30 | 3,300 | 810 | 6 | 810 | 10 | 1,240 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල අනුමත කරන ලද ප්‍රතිපාදන හා අමාත්‍යාංශයේ බැංකු ජංගම ගිණුම්වල පවතින ශේෂයන් සැලකීමෙන් තොරව, පුරුද්දක් වශයෙන් අමාත්‍යාංශය විසින් එක් එක් වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් අතිරේක අග්‍රිම සඳහා ඉල්ලීම් කර තිබුණි. ලැබුණු තොරතුරු අනුව , 2012 ඔක්තෝබර් මාසයේදී ලැබුණු රු.මිලියන 35.95 ක අග්‍රිම මුදල් මාස 7 කට වැඩි කාලයක් උපයෝජනය කරමින් පැවති අතර 2013 නොවැම්බර් මාසයේදී ලැබුණු රු.මිලියන 626.68 ක අග්‍රිම මුදල්වලින් රු.මිලියන 420.78 ක් මාස 5 කට වැඩි කාලයක් උපයෝජනය කරමින් පැවතුණි. තවද 2014 නොවැම්බර් මාසයේදී ලැබුණු රු.මිලියන 416 ක අග්‍රිමවලින් රු.මිලියන 26.71 ක අග්‍රිම 2014 දෙසැම්බර් 31 දිනට බැංකු ජංගම ගිණුමේ නිෂ්කාර්යව පැවතුණි.

(ආ) අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මේ වැය විෂයය 04 ක් යටතේ සිදුකරන ලද කාර්යයන් සඳහා වූ රු. මිලියන 89.4 ක ඉතිරිකිරීම, 2014 දෙසැම්බර් 31 දින ජාතික පාසැල් 149 ක ප්‍රමුඛතා හා නිශ්චිත අවශ්‍යතා හඳුනා නොගෙන ජාතික පාසැල් සඳහා මුදාහැර තිබුණි. තවද පාසැල් 125 ක සිදුකරන ලද වැඩවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය 2015 ජුනි 30 වන විටත් වාර්තා කර නොතිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල අරමුදල් වැය කළ බවට වාර්තා කර තිබුණද සම්පූර්ණ මුදලම පාසැල් සංවර්ධන සමිති බැංකු ගිණුම්වල වැය නොකළ අරමුදල් ලෙස පැවතුණු බව නිරීක්ෂණය විය.

3.2 භෞතික ප්‍රගතිය

--------------------

2012 – 2016 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන අනුව, ශිෂ්‍ය කාර්ය සාධනය වැඩිදියුණු කිරීම මඟින් උසස්පෙළ විද්‍යා අංශ සඳහා ශිෂ්‍ය සහභාගීත්වය වැඩිකිරීමේ අරමුණින් තාක්ෂණික විද්‍යාගාර ඉදිකිරීම, එම විද්‍යාගාර සඳහා විද්‍යාගාර උපකරණ හා වෙනත් උපකරණ ප්‍රසම්පාදනය කිරීම සහ ගුරුවරුන් සඳහා පුහුණුව ලබාදීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 860 ක් ඉදිකිරීම සඳහා අමාත්‍යාංශය කටයුතු කර 2012 සිට 2014 කාල පරිච්ඡේදය සඳහා සලසන ලද රු.මිලියන 8,283 ක වෙන්කිරීම් වලින් 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 7,787 ක මුදලක් වැය කර ඇති බව නිරීක්ෂණය විය. විද්‍යාගාර 821 ක ඉදිකිරීම් වැඩ 2014 දෙසැම්බර් 31 දිනට නිම කර තිබූ අතර ඉතිරි විද්‍යාගාර 39 හි ඉදිකිරීම් වැඩ එදිනට කෙරෙමින් පැවැතුණි. ඉන් විද්‍යාගාර 11 ක ඉදිකිරීම් වැඩ අතරමඟ අත්හැර දමා තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු ඉදිරිපත් කරන ලද කාර්ය සාධන බැඳුම්කර 2015 ජුනි 15 වන විටත් මුදල් කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ආ) ලැබුණු තොරතුරු අනුව, 2013 වර්ෂයේ අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා ඉදිරිපත් වූ දීප ව්‍යාප්ත සිසුන් සංඛ්‍යාවෙන් සියයට 16 ක් විද්‍යා විෂයය සඳහා ඒ හා බී සාමාර්ථ ලබා තිබුණි. කෙසේ වුවද එම සාමාර්ථ අනුපාතය 2014 වර්ෂයේදී සියයට 13 දක්වා අඩුවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට පාසැල් 150 ක අ.පො.ස (උසස් පෙළ) විද්‍යා විෂය ධාරාව සඳහා නව පන්ති හඳුන්වා දීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද 2014 දෙසැම්බර් 31 දිනට පාසැල් 140 ක විද්‍යා විෂය ධාරාවේ නව පන්ති ආරම්භ කර තිබුණි. එම පාසැල්වල විද්‍යා විෂය ධාරාව සඳහා එක් ශිෂ්‍යයකු හෝ සුදුසුකම්ලාභී ගුරුභවතුන් නොමැතිවීමේ ප්‍රතිඵලයක් ලෙස තවත් පාසැල් 10 ක නව පන්ති ආරම්භ කර නොතිබූ බව විගණනයේදී අනාවරණය විය. ලැබුණු තොරතුරු අනුව, අ.පො.ස (උසස් පෙළ) විද්‍යා විෂය ධාරාව සඳහා නව පන්ති ආරම්භ කළ පාසැල් 08 ක විෂයයන් 3 ටම ගුරුභවතුන් නොමැති වූ අතර 2014 දෙසැම්බර් 31 දිනට එවැනි තවත් පාසැල් 57 ක ගුරුවරු 88 ක් සඳහා පුරප්පාඩු පැවතුණි.

(ඇ) රු.මිලියන 11.56 ක වෙන් කිරීමක් සහිතව 2012 වර්ෂයේදී ව්‍යාපෘතිය විසින් " පාසැල් පදනම් ගුරු සංවර්ධන වැඩසටහන " ආරම්භ කර තිබූ අතර ඉන් රු.මිලියන 3.72 ක මුදලක් 2014 දෙසැම්බර් 31 දක්වා වැය කර තිබුණි. සියළු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්, සැලසුම් හා සම්බන්ධීකරණ නිලධාරීන් සහ ගුරු පුහුණු විද්‍යාලවල විදුහල්පතිවරුන් ආදීය සඳහා පුහුණු හා අධ්‍යාපන වැඩසටහන් පවත්වා තිබුණද, වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ විදුහල්පතිවරුන්ගේ අනවබෝධය වැඩසටහන සඳහා පාසැල් ගුරුවරුන්ගේ ආකල්ප හා කැපවීම පිළිබඳ දූර්වලතා, මූල්‍ය හා භෞතික සම්පත් වෙන්කිරීම් නොමැතිවීම, ගුරුභවතුන්ගේ සංවර්ධනයට සෘජුවම අදාළ නොවන වෙනත් කාර්යයන් ක්‍රියාත්මක කිරීම වැනි කරුණු රාශියක් හේතුවෙන් සංවර්ධන වැඩසටහන මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි.

(ඉ) ඩෙස්ක්ටොප් පරිගණක 50,754 ක් , ලැප්ටොප් පරිගණක 674 ක්, ප්‍රින්ටර්ස් 3,076 ක්, ස්කැනර්ස් 769 ක් සහ වෙනත් උපාංග 769 ක් මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සඳහා ප්‍රසම්පාදනය කිරීමට 2014 වර්ෂයේදී රු.මිලියන 5,825 ක මුදලක් ව්‍යාපෘතිය විසින් වැය කර තිබුණි. තෙකලා විදුලි සැපයුම් නොමැති වීම, බෙදාහැරීම් පුවරු (distribution board) සවි නොකිරීම හා එම විද්‍යාගාර විවෘත කිරීමේ උත්සවවල ප්‍රමාදයන් වැනි කරුණු කිහිපයක් හේතුවෙන් මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 464 ක් 2015 ජුනි 15 දින වන විටත් උපයෝජනයෙන් තොරව හෝ ඌන උපයෝජිතව පැවතුණි.

3.3 මූල්‍ය පාලන පිළිබඳ කරුණු
--------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ගනුදෙනු අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනයකට භාජනය කර නොතිබුණි.

(ආ) වර්ග 11 ක් යටතේ ලංසු කැඳවීම මගින් රු.මිලියන 107.69 පිරිවැයකට සමාලෝචිත වර්ෂය තුළදී මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සඳහා විද්‍යා උපකරණ හා රසායනික ද්‍රව්‍ය විෂයයන් 586 ක් ප්‍රසම්පාදනය කර තිබුණි. අයිතම වශයෙන් ලංසු කැඳවූයේ නම් හා ලංසු ඇගයීමේදී එක් එක් අයිතමවල මිල පිළිබඳ සැලකීමක් දැක්වූයේ නම් රු.මිලියන 12.30 ක මුදලක් ඉතිරි කර ගත හැකිව තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද වර්ග 04 ක් යටතේ ලී බඩු අයිතම 14 ක් ප්‍රසම්පාදනය සඳහා ලංසු කැඳවා තිබූ අතර එම ලංසු විෂයයන් වශයෙන් කැඳවූයේ නම් රු.706,160 ක මුදලක් ඉතිරි කරගත හැකිව තිබුණි.

(ඇ) 2014 වර්ෂයේදී පැවැත් වූ ගුරුභවතුන් සඳහා වූ උපහාර උත්සවයක් සඳහා එක් සිහිවටනයකට රු.1,200 බැගින් සිහිවටන 850 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා රු.මිලියන 1.17 ක මුදලක් ව්‍යාපෘතිය විසින් වැයකර තිබුණි. කෙසේ වුවද, සමාන පිරිවිතරයෙන් යුතු සිහිවටන එකක් රු.650 බැගින් විවෘත වෙළඳපොලෙන් ප්‍රසම්පාදනය කිරීමට හැකියාව තිබූ බව විගණනයේදී අනාවරණය විය. තවද ව්‍යාපෘතිය විසින් රු.මිලියන 13.17 ක පිරිවැයකට මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සඳහා සිහිවටන පුවරු 70 ක් ප්‍රසම්පාදනය කර සවිකර තිබුණි. විවෘත වෙළඳපොලේ සමාන පිරිවිතරයකින් යුතු සිහිවටන පුවරුවක් රු.129,000 ක්ව තිබියදී ව්‍යාපෘතිය විසින් මිල ගණන් කැඳවා තිබුණු සිහිවටන ඒකකයක් රු.174,000 ක් විය. ඉහත සඳහන් අවස්ථාවලදී, සැපයුම්කරුවන් තෝරා ගැනීම සඳහා මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද ලබාගත් මිල කැඳවීම්වල අව්‍යාජ බව තහවුරු කර ගැනීම සඳහා විශ්වාසදායී සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.